# මඛාදේව ජාතකය

තවද එක්සමයෙක්හි සර්වලෝකෛක දීපායමාන වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන මහා විහාරයෙහි වාසය කරණ සේක් මහාභිනික්මන් අරභයා මේ ජාතකය වදාළසේක. එක්සමයෙක්හි භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ මහභිනික්මන් වර්ණනා කොට කොට උන්සේක. එකල්හි සර්වඥයන් වහන්සේ දම්සභාමණ්ඩපයට අවුත් බුද්ධාසන මස්තයෙහි වැඩහුන් සේක් භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට මහාණෙනි, දැන් කිනම් කථාවකින් යුක්තව උනුද කිනම් කථාවක් දැන් තොපට අඩාලවීදැයි වදාරා සාමිනි අනික් කථාවකින් යුක්තව උනුමෝ නෙවම්හ. නුඹවහන්සේගේ මහනික්මන් වර්ණනා කොට කොට උනුම්හයි කී කල්හි මහණෙනි, සර්වඡයන් වහන්සේ නික්මුනේ දැන් මතු නොවෙයි පළමුත් නික්මුනෝවේදැයි වදාළසේක. භික්ෂූන් වහන්සේ ඒ අර්ථය ප්‍රකාශකරණු සඳහා සර්වඥයන් වහන්සේට ආරාධනා කළසේක. භාග්‍යවත්වූ බුදුරජානන් වහන්සේ භාවාන්තර ප්‍රවජ්ජන්න වූ කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස විදේහ රාජ්‍යයෙහි මියුලුනුවර මඛාදේව නම් රජ්ජුරුකෙනෙක් දශරාජ ධර්මයෙන් අකොප්‍යකොට සර්වධර්මිෂ්ඨව රාජ්‍යය කරන්නාහුය. ඒ රජ්ජුරුවෝ සුවාසුදහසක් අවුරුදු කුමාර ක්‍රීඩාකොට සුවාසුදහසක් අවුරුදු යුවරජකම්කොට සුවාසුදහසක් අවුරුදු එකරාජ්‍යකොට බොහෝකල් යවා එක් දවසක් කපුවාට බණවා කියන්නාහු යහළු කපුව යම් දවසක් මා ඉස නරකෙසක් දුටුයේවීනම් එදවස් මට කියවයි කිවුය. කපුවාත් බොහෝ කලයක් යවා එක් දවසක් රජ්ජුරුවන්ගේ අඳුන්වන් කෙස් අතුරේ තුබු එකම නරකෙසක් දැක රජ්ජුරුවන් වහන්ස, කෙස් අතුරේ නරකෙන්දක් පෙණන්නේය යි කීය. එසේවිනම් සබඳ කපුව නරකෙස උදුරා මා අත්ලෙහි තබවයි කී කල්හි රන් අඬුවෙන් නරකෙස උදුරා රජ්ජුරුවන් අත්ලෙහි තැබීය. එසමයෙහි රජ්ජුරුවන්ට සූවාසුදහසක් අවුරුදු ඉතිරිව සිටියේය. එසේවී නමුත් නරකෙස දැකලාම මාත්‍යූරාජයා ඇවිත් සමීපයෙහි සිටියාක් මෙන්ද තමන් ගිනිගත් පන්සලකට වන්නාක් මෙන්දැයි සිතමින් සංවේගයට පැමිණ තුමු තමන්ට අවවාද කරනුනාහු අඥානවූ මඛාදේවයෙනි, ඉස නර නැගෙණතුරුත් කෙලෙසුන් ඇරපය නුහුනුවාහුද තොපසේ වූ අඥානයෝ නැතැයි තමන්ටම නින්දා කළාහුය. මෙසේ රජ්ජුරුවන්ට නරකෙස් පහළවූ නියාව කල්පනා කරත් කරත් අභ්‍යන්තරයෙහි දහවැදගත සකල ශරීරයෙන් ඩා වැගිරෙන්නට පටන්ගත්තේය. එවෙලෙහි රජ්ජුරුවෝ අදම නික්ම මහණදම් කරන්නට වටනේයයි කපුවාට ලක්ෂයක් වස්තු උපදිනා ගම්වරයක් දී ප්‍රධාන පුත්‍රවූ රාජ්‍ය කුමාරයන් කැඳවා පුත, මා ඉස නරකෙසක් පහල විය. එසේහෙයින් මම මහලුව ගියෙම් මා විසින් මනුශ්‍යලෝකයෙහි අනුභව කළ මනා සම්පතුන් අනුභව කරන ලද්දේය. දැන් දිව්‍ය සම්පතුන් අනුභව කරන්නාව කැමැත්තෙමි. එසේ හෙයින් මහණවන්ට දැන්ම මට කල් වන්නේය. තෙපි මේ රාජ්‍යය පවරා ගනුව. මම මහණව මඛාදේව නම් අඹ උයනේ වැස මහණ දම් කෙරෙමි කීවුය. මෙසේ මහණවනු කැමැත්තොවෝ රජ්ජුරුවන් කරා අමාත්‍යයෝ එළඹ ස්වාමීනි නුඹ වහන්සේ කවර කාරණයකින් මහණ වන සේක්දැයි විචාලෝය. රජ්ජුරුවෝ නරකෙස  අතින් ගෙන අමාත්‍යායන්ට තමන් මහණ වන කාරණය කියන්නාහූ ප්‍රථම වයස මධ්‍යම වයස පශ්චිම වයස යයි කියන දෙතුන් වයසම නසන හෙයින්  වයස පැහැර ගන්නා වූ මේ නරකෙස මගේ හිස හටගත්තේය. හිස නරකෙස් අටගත්විටම මරණය අවුත් නලල්තෙළහි සිටියා නම් වෙයි. නරකෙස් නම් යමරජ්ජුරුවන්ගෙන් එවුදේව දූතයන් වැන්නෝය. එසේ හෙයින් අදම මට මහණවන්නට කල් වන්නේයයි අමාත්‍යයන්ට කියා එදවස්ම රාජ්‍ය හැර ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවැදිව මඛාදේව නම් අඹ උයනේ වෙසෙමින් ස්වාසූදහසක් අවුරුදු මුළුල්ලේහි මෛත්‍රිය කරුණා මුදිතා උපේක්ඛා යයි කියන ලද චතුර් විද බ්‍රහ්ම විහාර භාවනා කොට නොපිරිහුනා වූ ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලෝකයෙහි ඉපිද නැවත එයින් චුත අවුත් මියළුනුවර ඉපිද පසුබස්නා වූ තමන්ගේ වංශය ගලපා එම අඹ උයනෙහි මහණව  බ්‍රහ්ම විහාර බාවනා කොට නැවත බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය. සාස්තෘන් වූ බුදුරජානන් වහන්සේ මහණෙනි සර්වඥයන් මහභික්නික්මන් නික්මුණෝ දැන් මතු නොවෙයි පෙරත් නික්මුණෝම වේදැයි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාලා චතුරාර්ය සත්‍ය ප්‍රකාශ කලසේක. චතුස්සත්‍යය ධර්මදේශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ අතුරෙන් සමහරකෙණෙකුන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටි සේක. සමහර කෙණෙකුන් වහන්සේ සකෘදාගාමී ඵලයෙහි පිහිටි සේක. සමහර කෙණෙකුන් වහන්සේ අනාගාමී ඵලයෙහි පිහිටි සේක. මෙසේ බුදුරජානන් වහන්සේ අතීත කථාවත් වර්ථමාන කථාවත් දෙක එක් කොට සන්ධි ගලපා මේ මඛාදේව ජාතකය නිමවා වදාලසේක. එසමයෙහි කපුවා නම් දැන් මේ ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ප්‍රධාන පුත්‍ර නම් දැන් මේ රාහුල ස්ථිවිරයෝය. එසමයෙහි මඛාදේව රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජු වූ මම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.